## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
## Bhiksu University of Sri Lanka - Anuradhapura

**2017/2018 අධ්‍යයන වර්ෂය - සමාසික II පරීක්ෂණය**
**දෙවන වසර**
**2017/2018 Academic Year - Semester II Examination**
**Second Year**

### ගුරු වෘත්තීය සංවර්ධනය - EDSC 22073

**උපදෙස්**
ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලකුණු **විස්සක් (20)** ක් පමණි. කාලය පැය 02 යි.

---

1.
- I. ගුරුවරයා පිළිබඳ දාර්ශනිකයන් දැක්වූ පිළිගත් නිර්වචනයක් ලියන්න. (ලකුණු 03)
- II. වෘත්තියක පැවතිය යුතු ලක්ෂණ **හතරක්** ඇසුරින් ගුරු වෘත්තිය හඳුන්වන්න. (ලකුණු 07)
- III. වෘත්තීයමය උසස් භාවය පිළිබඳ අපේක්ෂිත වෘත්තීයමය නිපුණතා ඇසුරින් ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තිකභාවය ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10)

2.
- I. භූමිකාවක පවතින තත්ව හතරෙන් **තුනක්** නම්කරන්න. (ලකුණු 03)
- II. අතීත ගුරු භූමිකාවෙන් වර්තමාන ගුරු භූමිකාව වෙනස්වන අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 07)
- III. 3 - T ආකෘතිය විමර්ශනාත්මකව අධ්‍යයනය කරන්න. (ලකුණු 10)

3.
- I. ගුරු පෞරුෂයක අක්‍රමිකතා (අයහපත් ලක්ෂණ) **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
- II. පෞරුෂය සංකල්පය නිර්වචන **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)
- III. සමබර පෞරුෂයක් ඇතිකරගැනීම උදෙසා ගුරුවරයා විසින් සංවර්ධනය කරගත යුතු ක්ෂේත්‍ර සාකච්ඡා කරන්න. (ලකුණු 10)

4.
- I. පූර්ව සේවා ගුරු පුහුණුවේ අරමුණු **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 03)
- II. සේවාස්ථ ගුරු පුහුණුව ලබාදිය හැකි ක්‍රම **හතරක්** හඳුන්වන්න. (ලකුණු 07)
- III. ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනය ලබාදෙන ආයතන හා එහි පාඨමාලා පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් කරන්න. (ලකුණු 10)

5.

I. පාසල් පාදක ගුරු සංවර්ධනය (SBTD) වැඩසටහනක් සැලසුම් කිරීමේදී පුහුණු අවශ්‍යතා හඳුනාගත හැකි ක්‍රම **තුනක්** ලියන්න. (ලකුණු 03)

II. පාසල් පාදක ගුරු සංවර්ධනය (SBTD) ක්‍රියාවලියේ ලක්ෂණ **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. ගුරු සංවර්ධනය පිළිබඳ සාම්ප්‍රදායික සංකල්පය හා නව්‍ය සංකල්පය සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

6. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක්** විස්තර කරන්න.

I. ගුරු මධ්‍යස්ථාන ආශ්‍රිත ගුරු අධ්‍යාපනය

II. ජාතික අධ්‍යාපන ආයතනය පිහිටුවීමේ අරමුණු

III. පාසල් ගුරු භූමිකාව

IV. සමාජ ගුරු භූමිකාව

(ලකුණු 10x02 = 20)